# නව සමසමාජ පක්‍ෂයේ ව්‍යවස්ථාව

**1. නාමය :-** 'නව සම සමාජ පක්‍ෂය'

**2. අන්තර් ජාතික සංවිධානයන්ට ඇති සම්බන්ධකම් :-**

(අ) ලංකාවේ දේශීය කොටස වශයෙන් මෙම පක්‍ෂය සිව්වැනි අන්තර් ජාතිකයට සම්බන්ධවේ.

(ආ) මෙම සම්බන්ධකමට අනුකූලව එම අන්තර් ජාතිකයේ ක්‍රියාමාර්ග හා අනපනත් මෙම පක්‍ෂය පිළිගනී. එහි පාලක මණ්ඩලය විසින් කලින් කල ගන්නට යෙදෙන තීරණ වලටද, මෙම පක්‍ෂය යටත් වේ.

**3. පරමාර්ථ හා අරමුණු :-**

(අ) පක්‍ෂයේ අරමුණු හා පරමාර්ථයන් වනුයේ තම ක්‍රියා මාර්ගයෙහි සඳහන් කරන ලද කරුණු වේ.

(ආ) පක්‍ෂයේ ක්‍රියාමාර්ග සංශෝධනය කළ හැක්කේ හෝ වෙනස් කළ හැක්කේ හෝ පක්‍ෂයේ සම්මේලනය කරනු ලබන තීරණයන් පිට පමණකි.

(ඇ) පක්‍ෂයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අදාලවන හැම දෙයක්ම පක්‍ෂයේ කටයුතු වලට ඇතුළත් වේ.

**4. සාමාජිකත්වයේ කොන්දේසි :-**

(අ) පක්‍ෂයට ඇතුලත් වන විට හා ඉන්පසුවත් සියලුම පාක්ෂික හා සාමාජිකයින් විසින් මෙම කොන්දේසි සියල්ලම පිළිපැදිය යුතුවේ.

1. පක්‍ෂයේ ක්‍රියාමාර්ගය පිළිගැනීම.
11. පක්‍ෂයේ ලෝකල් සභාවක,කණ්ඩායමක හෝ පක්‍ෂයේ වෙනත් මණ්ඩලයක, ක්‍රියාකාරී සාමාජිකයෙකු මෙන්ම පක්‍ෂයේ වැඩ කටයුතු වලට මධ්‍යම කාරක සභාව පිළිගන්නා ප්‍රමාණයට සහභාගී වීම.
111. පක්‍ෂයේ අරමුදල සඳහා මාස්පතා සාමාජික මුදලක් ගෙවීම අනිවාර්ය විය යුතු අතර, එම සාමාජික මුදල් කොපමණ විය යුතුද යන්න ආදායම් මට්ටමට අනුව මධ්‍යම කාරක සභාව විසින් තීරණය කෙරේ.
   තුන්මසක සාමාජික මුදල් හිඟ තබන, ලෝකල් සභාවට නොපැමිණෙන පාක්ෂිකයෙකු සාමාජිකත්වයට පත්වන අතර, සාමාජිකයාගේ නම කැපී යනු ඇත.

(ආ) පක්‍ෂයට පාක්ෂිකයින් ඇතුළත් කිරීමේ සම්පූර්ණ බලය ඇත්තේ මධ්‍යම කාරක සභාව පමණී.

**5. සාමාජිකයින් පත් කර ගැනිම :-**

පක්‍ෂයට ඇතුල්වූ සාමාජිකයින් ඒ ඇසිල්ලෙහිම පුහුණුව ලබන සාමාජිකයින් හැටියට ලොකල් සභාවකට හෝ 10 (ආ) වගන්තිය අනුව, මධ්‍යම කාරක සභාව විසින් වෙනත් මණ්ඩලයකට හෝ පත් කරනු ලැබේ.

**6. සාමාජිකයින්ගේ අයිතිවාසිකම් :-**

පහත සඳහන් අයිතිවාසිකම් හැර ස්ථිර පාක්ෂිකයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් සියල්ලක්ම සාමාජිකයින්ට ඇත්තේය. එම නැති අයිතිවාසිකම් මේවාය.

1. කිසිම ප්‍රශ්නයකදී ඡන්දය පාවිච්චි කිරීමට ඔවුනට අයිතියක් නැත.
11. ලෝකල් සභාවක නිලධාරියෙකු හැටියට හෝ පක්‍ෂයේ පාලක මණ්ඩලයක සාමාජිකයෙකු හැටියට හෝ ඔවුන් පත්කළ නොහැක.
111. පක්‍ෂයේ සම්මේලනයට නියෝජිතයන් වශයෙන් ඔවුන් පත්කල නොහැක.
1V. පක්‍ෂයේ සියලු රහස් කටයුතු වලින් ඔවුන් බැහැර කරනු ලැබේ. එහෙත් කිසියම් විශේෂ කරුණු සඳහා මධ්‍යම කාරක සභාව විසින් මීට වෙනස් තින්දු කළ හැක.

**7. ඕනෑ විටක මධ්‍යම කාරක සභාවට සාමාජිකයින් එකවරම පක්‍ෂයෙන් අස් කළ හැක.**

**8. පාක්ෂිකයින් සාමාජිකයින් වශයෙන් පහළ හෙළීම.**

පක්‍ෂයේ ක්‍රියාමාර්ගය පිළිගැනීම සම්බන්ධ වූ 4 (1) යන වගන්තිය යම් පාක්ෂිකයෙකු විසින් උල්ලංඝනය කරන ලද්දේ නම් ඔහු වහාම සාමාජිකත්වයට පමුණුවන්නට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

න්‍යාය සහ භාවිතය ගැන මනා අවබෝධයක් ඇතිවූද, කැපවීමකින් යුතුව කටයුතු කරන කැපී පෙනෙන ලෙස සංවිධානාත්මක කටයුතු වල යෙදී සිටින බවට මධ්‍යම කාරක සභාවට හැඟී යන පාක්ෂික සහෝදරවරු කේඩර්වරුන් ලෙස සලකනු ලැබේ.
එහෙත් අනෙක් පාක්ෂිකයිනට වඩා කිසියම් ආකාරයක අයිතිවාසිකම් මෙම සහෝදරවරුන්ට හිමිවනු ඇතැයි මින් හැඟී නොයා යුතුය.

## 10. පක්ෂයේ මූලික සංවිධාන :-

(අ) පක්ෂයේ මූලික සංවිධානය ලෝකල් සභාවයි.

(ආ) පක්ෂයේ සෑම පාක්ෂිකයෙක්මද, සාමාජිකයකුමද මධ්‍යම කාරක සභාව වෙත නියමයක් නොකරන්නේ නම්, ලෝකල් සභාවක සාමාජිකයෙකු විය යුතුය.

## 11. ලෝකල් සභාව ( පක්ෂ ශාඛාව )

(අ) මධ්‍යම කාරක සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ හෝ නියමය අනුව එම සභාවලට යෝග්‍ය යයි හැඟෙන ආකාරයට ලෝකල් සභා පිහිටවනු ලැබේ.

(ආ) යටත් පිරිසෙයින් පාක්ෂිකයින් තුන් දෙනෙකුගෙන්ද, මධ්‍යම කාරක සභාව මගින් ඇතුලත් කරන ලද සාමාජිකයින්ගෙන්ද ලෝකල් සභාවක් සංයුක්ත විය යුතුයි.

(ඇ) සෑම ලෝකල් සභාවකටම අයත් කටයුතු කලින් කලට මධ්‍යම කාරක සභාව හෝ ප්‍රාදේශීය සභාව විසින් හෝ පැහැදිලි කරනු ලැබේ.

(ඈ) අඩු ගණනේ මසකට දෙවරක් ලෝකල් සභා රැස්වීමක් පැවැත්විය යුතුය. එම රැස්වීම් වලදී තම සාමාජිකයින්ගේ වැඩ කටයුතු සමාලෝචනය කිරීමද, මධ්‍යම කාරක සභාව හෝ ප්‍රාදේශීය සභාව මඟින් නිකුත් කරන ලද දන්වීම් සහ අනපනත් සලකා බැලීම ද කල යුතුය. මුල් ලෝකල් සභා වාරයේදී දේශපාලනමය ප්‍රශ්න සාකච්ඡාවට ගනු ලබන අතර, දෙවන ලෝකල් සභා වාරය සංවිධානාත්මක කටයුතු සඳහා යෙදවිය හැකිය.

(ඉ) හැම ලෝකල් සභාවක්ම ලේකම් කෙනෙකු තෝරා පත් කල යුතුය.

(ඊ) කම්කරුවන් වූ පාක්ෂිකයන් සහ සාමාජිකයන් ඔවුන්ගේ ආයතනයකට හෝ කර්මාන්තයකට සම්බන්ධ ලෝකල් සභාවකට පිරිසක් වශයෙන් ඇතුලත් වෙයි. එබඳු පාක්ෂිකයන් ප්‍රදේශවල වැඩ සඳහා පළාත් ලෝකල් සභා වලටත් සම්බන්ධ කිරීම පුලුවන. පළාතේ ලෝකල් සභාවලට අයත් කම්කරු සාමාජික හා පාක්ෂිකයන් ඔවුන්ගේ ආයතනයට හෝ කර්මාන්තායතනයට සම්බන්ධ ලෝකල් සභාවකට සම්බන්ධ කිරීම කළ යුතුය.

## 12. ප්‍රාදේශීය සභාව :-

(අ) මධ්‍යම කාරක සභාවේ අනුමැතිය යටතේ ප්‍රදේශය සීමා නිර්ණයකිරීම ප්‍රාදේශීය සභාවක් විසින් කරනු ලැබේ.

(ආ) මෙසේ තීරණය කරන ලද ප්‍රාදේශිකයට අයත් පාක්ෂිකයන් වර්ෂයකට වරක් රැස්වී ප්‍රාදේශීය කොමිටියක් පත් කළ යුතුය. එම ප්‍රාදේශීය කොමිටිය එම ප්‍රදේශයේ පාක්ෂික වැඩ වලට වගකිව යුතුය.

(ඇ) සෑම ප්‍රාදේශීය සභාවකටම ලේකම්වරයෙකු තෝරා පත් කළ යුතු අතර, මධ්‍යම කාරක සභාවේ අනුමැතිය පරිදි මෙම ලේකම්වරු මධ්‍යම කාරක සභා රැස්වීමට නිරීක්ෂකයන් ලෙස සහභාගි විය යුතුය.

(ඈ) මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව යම් ප්‍රදේශීය සභාවකට තම ප්‍රදේශයට අයත් සියලු මැතිවරණ වෙනුවෙන් අපේක්ෂයන් තෝරා ගත හැකිය.

## 13. මධ්‍යම කාරක සභාව :-

(අ) පක්ෂයේ සම්මේලනය වාරය අතරතුරේ ඇති උසස්ම මණ්ඩලය වන මධ්‍යම කාරක සභාව පක්ෂයේ ක්‍රියාමාර්ගය ව්‍යවස්ථාව සහ සම්මේලනයේ තීරණයක් අනුව පක්ෂයේ වැඩට මග පෙන්වීමද පක්ෂයේ ක්‍රියා පටිපාටිය නියම කිරීමටද වගකිව යුතුය.

(ආ) පක්ෂයේ සම්මේලනයක් මගින් තෝරා පත්කර ගනු ලබන මධ්‍යම කාරක සභාව මෙසේ යුක්ත විය යුතුය.
සභිකයින් 30 දෙනෙකුගෙන් සහ,
500 වැඩි 1000 දක්වා සෑම පාක්ෂිකයන් 50 දෙනෙකුට එක් සභිකයෙකු බැගින් ද 1000 වැඩි 2500 දක්වා සෑම පාක්ෂිකයන් 100 දෙනෙකුට එක් සභිකයෙකු බැගින්ද,2500 ට වැඩි 4900 දක්වා සෑම පාක්ෂිකයන් 150 දෙනෙකුට එක් සභිකයෙකු බැගින්ද වනසේ විය යුතුය.
මධ්‍යම කාරක සභාවේ ඇතිවන ඕනෑම ඇබෑර්තුවකට හෝ විශේෂ අවශ්‍යතාවයකට කෙනෙකු පත්කර ගැනීමේ බලය මධ්‍යම කාරක සභාවට තිබේ.

(ඈ) යමකිසි අවස්ථාවක ද සභිකයකු ඉල්ලා අස්වුවහොත් හෝ මලොත් හෝ වෙනයම් ක්ස්යම් කරුණක් නිසා බොහෝ කලකට මධ්‍යම කාරක සභාවේ කටයුතු කරන්නට නොහැකි නම් හෝ මධ්‍යම කාරක සභාවේ ඇබැර්තුවක් ඇති වන්නේ යයි සලකනු ලැබේ.

(ඇ) සංවිධායක මණ්ඩලය විසින් පිළියෙල කරනු ලබන න්‍යාය පත්‍රයක් අනුව අඩු වශයෙන් මසකට වරක්වත් මධ්‍යම කාරක සභාව රැස්විය යුතුය. විශේෂ යෝජනාවක් හෝ ඉල්ලීමක් සාකච්ඡා කිරීමටද මධ්‍යම කාරක සභාව රැස්විය යුතුය.

(ඉ) මධ්‍යම කාරක සභ රැස්වීම් වලට සණපූර්ණය එහි සාමාජික සංඛ්‍යාවෙන් භාගයකට වැඩි විය යුතුය.

(ඊ) මධ්‍යම කාරක සභාව සුදුසු යැයි පිළිගන්නා තීන්දු අවශ්‍යතාවය මත, පක්ෂ සාමාජිකත්වයට අභ්‍යන්තර නිවේදනය පත්‍රයක් ( බුලටිනයක් ලෙස ) ඉදිරිපත් කළ යුතුය.

## 4. පක්ෂයේ ප්‍රධාන ලේකම් :-

මධ්‍යම කාරක සභාව තම සභිකයෙකු ප්‍රධාන ලේකම් වශයෙන් පත් කරයි.

## 5. භාණ්ඩාගාරික :-

(අ) මධ්‍යම කාරක සභාව තම සභිකයෙකු භාණ්ඩාගාරික වශයෙන් පත් කරයි.

(ආ) එම භාණ්ඩාගාරික ඔහුට භාර කටයුතු වල කොටසක් වශයෙන් මාසික අය - වැය වාර්තාවක් මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම වාර්ෂික සම්මේලනයට ඉදිරිපත් කිරීමට වාර්ෂික අය - වැය ලේඛණයක් පිළියෙල කළ යුතුය.

(අ) අඩු වශයෙන් මධ්‍යම කාරක සභිකයින් ලෙසට සිටින පූර්ණ කාලීනයින්ගෙන් සමන්විත සංවිධායක බියුරෝවක් මධ්‍යම කාරක සභාව විසින් පත්කළ යුතුය. දේශපාලන වැඩ පිළිවෙල හැර අනිකුත් කටයුතු සම්බන්ධව මධ්‍යම කාරක සභාවේ රැස්වීම් අතරතුරේදී මධ්‍යම කාරක සභාවේ බලය හිමිවන මෙම බියුරෝ සභාව පක්ෂයේ එදිනෙදා වැඩ වලට මග පෙන්විය යුතුය. එයට ලේකම් වරයෙක් සිටිය යුතුය.

(ආ) වෘත්තීය සමිති වල පක්ෂයෙන් එදිනෙදා වැඩවලට මග පෙන්වීමට වෘත්තීය සමිතියේ බියුරෝ සභාවක් මධ්‍යම කාරක සභාව විසින් පත් කල යුතුය. එයට ලේකම් වරයෙක් සිටිය යුතුය.

(ඇ) කර්තෘ මණ්ඩලයක් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය. එහි ලේකම් වරයෙකු සිටිය යුතු අතර, ඔහු ප්‍රධාන කර්තෘ විය යුතුය.

(ඈ) ජන මණ්ඩලයක් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය. එයට ලේකම්වරයෙකුද විය යුතුය.

(ඉ) ජාතීන් වෙනුවෙන් සම්බන්ධීකරණය සඳහා කමිටුවක් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය.

(ඊ) අභ්‍යන්තර මණ්ඩලයක් මධ්‍යම කාරක සභාව විසින් පත් කල යුතුය. එයට ලේකම්වරයෙකු ද විය යුතුය.

(උ) අධ්‍යාපන ලේකම්වරයෙකු හා ජාත්‍යන්තර ලේකම්වරයෙකු මධ්‍යම කාරක සභාව විසින් පත් කල යුතු අතර, ඔවුන් අභ්‍යන්තර මණ්ඩලයට අනුයුක්ත කල හැකිය.

(ඌ) ප්‍රධාන ලේකම්, සංවිධායක ලේකම්, වෘත්තීය ලේකම්, අභ්‍යන්තර ලේකම්, ජාතික ප්‍රශ්න සම්බන්ධීකරණ ලේකම්, ජන ලේකම්,කර්තෘ,භාණ්ඩාගාරික යන අංශ වල ලේකම්වරුන්ගේ දේශපාලන විධායක සභාවක් මධ්‍යම කාරක සභාව විසින් පත් කල යුතුය. මධ්‍යම කාරක සභාවේ රැස්වීම් වාර තුනේදී පක්ෂයේ දේශපාලන වැඩ පිළිවෙල ද තීරණය කරන මෙම විධායක සභාවට එම දේශපාලන ප්‍රතිපත්ති සම්බන්ධව, මධ්‍යම කාරක සභාවේ රැස්වීම් අතරතුරේදී මධ්‍යම කාරක සභාවේ බලය හිමිවේ.

(එ) මධ්‍යම කාරක සභාවට අවශ්‍ය යැයි කල්පනා කරන වෙනත් ඕනෑම මණ්ඩලයක් පත් කල හැකිය.

7. 16 වන වගන්තිය අනුව පත්වන මණ්ඩල තීරණ වහාම ක්‍රියාවේ යෙදවෙනවා ඇත. එහෙත් එම තීරණ වෙනස් කල යුතුද නැතහොත් එකඟත්වය ඇති විය යුතු ද යන්න සලකා බලනු සඳහා ඊළඟ මධ්‍යම කාරක සභාවේ සැලකිල්ලට භාජනය වනවා ඇත.

## 18. පාක්ෂික සම්මේලනය :-

පාක්ෂික සාමාජික නියෝජිතයන්ගෙන් සමන්විත වූ පක්ෂයේ උසස්ම මණ්ඩලය වන්නේ පක්ෂයේ සම්මේලනයයි. නියෝජිතයන්ගේ ගණන හා පත්කරන ආකාරය මධ්‍යම කාරක සභාව විසින්ම නියම කල යුතුය. සම්මේලනයේ තීරණ මුළු පක්ෂය විසින් අනුගමනය කල යුතුවා පමණක් නොව, එය වෙනස් කිරීම මතු සම්මේලනයකින් විනා කල හැකි නොවේ. එහෙත් ඉතාම හදිසි හා වැදගත්ම කරුණක් සම්බන්ධව සම්මේලනයේ තීරණයක් සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ ඊට ඉඳුරාම පටහැනි තීරණයකට බැසීමට හෝ මධ්‍යම කාරක සභාවට බලයක් තිබේ. එහෙත් එවැනි අවස්ථාවලදී එකී තීරණ අනුමත කිරීමට ඉදිරිපත් කරනු පිණිස විශේෂ සම්මේලනයක් මධ්‍යම කාරක සභාව විසින් අප්‍රමාදව කැඳවිය යුතුය.

19. (අ) සම්මේලනයක් වුවමනා වූ විට කැඳවීම මධ්‍යම කාරක සභාව සතු කාර්‍යයකි.
(ආ) හැකි පමණට අවුරුද්දකට වරක් පක්ෂයේ සාමාන්‍ය සම්මේලනයක් මධ්‍යම කාරක සභාව විසින් කැඳවිය යුතුය.
(ඇ) පහත සඳහන් අවස්ථාවලදී මධ්‍යම කාරක සභාව විසින් පක්ෂයේ විශේෂ සම්මේලනයක් කැඳවිය යුතුය.

<u>එම අවස්ථා නම් :-</u>

(1) 18 වෙනි වගන්තියේ ප්‍රකාර විශේෂ සම්මේලනයක් කැඳවීමට අවස්ථාව මධ්‍යම කාරක සභාවට සැලසුනු විට,
(11) විශේෂ සම්මේලනයක් කැඳවිය යුතු යැයි මධ්‍යම කාරක සභාවේ අදහස් වූ විට,
(111) පාක්ෂික සංඛ්‍යාවෙන් තුනෙන් පංගුවකට (1/3) වැඩි ගණනක් විසින්, විශේෂ සම්මේලනයක් විශේෂ කරුණක් හෝ කරුණු රැසක් සඳහා කැඳවන ලිපියකින් ඉල්ලුම් කල විට,
(1V) එම ලිපිය ලැබී යටත් පිරිසෙයින් මාස 3 ක් ගතවන්නට ප්‍රථම එම විශේෂ සම්මේලනය මධ්‍යම කාරක සභාව විසින් කැඳවිය යුතු.
(V) පක්ෂයේ සෑම සම්මේලන සියලු යෝජනා, වාර්තා ආදිය ඇතුලත් වූ වැඩ සටහන සලකා බැලීම පිණිස සියලුම ලෝකල් සභාවලට සම්මේලනයට පෙර යැවිය යුතුය.
(V1) පක්ෂයේ ඕනෑම පාක්ෂිකයෙකුට හෝ සාමාජිකයෙකුට පක්ෂයේ සම්මේලනයේ කල්පනාට භාජනය කිරීම පිණිස යෝජනා ඉදිරිපත් කල හැක. එවැනි හැම යෝජනාවක්ම මධ්‍යම කාරක සභාව විසින් පක්ෂයේ ඊළඟ සම්මේලන වාරයේ න්‍යාය පත්‍රයට ඇතුලත් කල යුතුය. එහෙත් එවැනි යෝජනාවක් සම්මේලනයකට වැඩ සටහනකට ඇතුලත් කිරීමට පෙර අඩු ගණනේ පාක්ෂිකයින් 25 දෙනෙකුගෙන් අත්සන්, ඒ වෙනුවෙන් තැබිය යුතු යැයි ඉල්ලීමට මධ්‍යම කාරක සභාවට පුලුවන. තවද, 19(අ) වගන්තිය අනුව කැඳවනු ලබන විශේෂ සම්මේලනයක න්‍යාය පත්‍රය සහ එම සම්මේලනය කැඳවීමට ඇති විශේෂ හේතුන්ද සීමා කිරීම මධ්‍යම කාරක සභාවට පුලුවන.

## 20. සාමාන්‍ය සම්මේලන :-

(අ) මධ්‍යම කාරක සභාව විසින් සෑම සාමාන්‍ය සම්මේලනයකම වැඩ සටහනෙහි පහත සඳහන් දය ඇතුලත් කල යුතුය.
1. සම්මේලනයේ අනුමැතිය ලබාගැනීම සඳහා ගතවූ සාමාන්‍ය සම්මේලනයේ පටන් මධ්‍යම කාරක සභාවේ සහ පක්ෂයේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක්.
11. සම්මේලනයේ අනුමැතිය ලබාගැනීම සඳහා ගතවූ සාමාන්‍ය සම්මේලනයේ පටන් මධ්‍යම කාරක සභාවේ දළ අය වැය වාර්තාවක්.
111. සම්මේලනයේ විවේචනයට භාජනය කිරීම හා අනුමැතිය පිණිස ඉදිරියට පැමිණෙන කාලයේදී පක්ෂය ඉදිරිපිට තිබෙන දේශපාලන කර්තව්‍යයන් පිළිබඳ මධ්‍යම කාරක සභාවේ යෝජනාවක්,
1V. සම්මේලනයේ විවේචනයට භාජනය කිරීම පිණිස හා අනුමැතිය පිණිස ඉදිරියට පැමිණෙන කාලයේදී පක්ෂය ඉදිරිපිට තබන සංවිධාන කර්තව්‍යයන් පිළිබඳ යෝජනාවක්,
V. සම්මේලනයේ විවේචනයට භාජනය කිරීම සඳහා හා අනුමැතිය පිණිස ඉදිරියට පැමිණෙන කාලයේදී පක්ෂය ඉදිරිපිට තබන ජාත්‍යන්තර ඉදිරි දර්ශන පිළිබඳ යෝජනාව.

(ආ) හැම සාමාන්‍ය සම්මේලනයකට අයත් අනෙක් වැඩ කටයුතු හැර එම සම්මේලනය මගින් මධ්‍යම කාරක සභාවක් තෝරා පත් කල යුතුයි.

## 21. මධ්‍යම කාරක සභාව තේරීම :-

1. සාමාන්‍ය සම්මේලනයක් විසින් මධ්‍යම කාරක සභාව මෙසේ තෝරා පත් කල යුතුයි.
11. 13 (ආ) වගන්තිය අනුකූලව මධ්‍යම කාරක සභාවේ ගණන කොපමණ විය යුතුද යන්න සම්මේලනය තීන්දු කරගත යුතුය.
111. මධ්‍යම කාරක සභාවට නම් යෝජනා කිරීම ඕනෑම පාක්ෂිකයෙකුට කල හැක.
1V. යෝජනා කරන ලද නම් ගණන මධ්‍යම කාරක සභාවේ ප්‍රමාණයට වඩා වැඩිවුනු කල්හී උවමනා වන නියෝජිත ප්‍රමාණය සාමාන්‍ය වැඩි ඡන්ද ලැබීම අනුව තෝරා පත් කළ යුතුවේ.

## 22. විශේෂ සම්මේලන :-

හැම විශේෂ සම්මේලනයකම න්‍යාය පත්‍රයේ පහත සඳහන් දේ ඇතුලත් විය යුතුය. එනම්,
1. මධ්‍යම කාරක සභාව විසින් සම්මේලනයට ඉදිරිපත් කරනු ලබන සියලුම කරුණු.
11. ඕනෑම පාක්ෂිකයෙකු විසින් පක්ෂයේ සංවිධානයක් විසින් හෝ 20 (ආ) වෙනි වගන්තිය අනුව විශේෂ සම්මේලනයකට ඉදිරිපත් කරනු ලබන සියලුම යෝජනා.

## 23. ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් සහ විනය :-

මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් පක්ෂය තුළ සාකච්ඡා කිරීමේ සම්පූර්ණ නිදහස් හා ක්‍රියා කිරීමේදී සම්පූර්ණ එකඟකම යන සිද්ධාන්තය පක්ෂයේ ප්‍රජාතාන්ත්‍ර අයිතිවාසිකම් සහ විනය පාලනය කරයි.

24. මධ්‍යම කාරක සභාවේ තීරණයන්ට සියලුම පාක්ෂික සංවිධාන සහ සියලූ පාක්ෂිකයින් හා සාමාජිකයින් බැඳෙති.

25. ප්‍රාදේශීය කාරක සභාවේ තීරණයන්ට එම ප්‍රාදේශීකයේ සියලූ පාක්ෂිකයින් සහ සාමාජිකයින් බැඳෙති.

26. ලෝකල් සභාවල තීරණයන්ට ඒ ඒ ලෝකල් සභාවල පාක්ෂිකයින් හා සාමාජිකයින් බැඳෙති.

27. ලෝකල් සභාවල තීරණ වෙනස් කිරීමට මධ්‍යම කාරක සභාවට හෝ ප්‍රාදේශීය මණ්ඩලයකට බලය තිබේ.

28. යම් පාක්ෂිකයෙක් හෝ සාමාජිකයෙක් හෝ පක්ෂ මණ්ඩලයක් හෝ තමා යටත් විය යුතු යම් තීරණයක් පිළි නොපදී නම් ඒ ඒ පාක්ෂික හෝ පක්ෂ මණ්ඩලය පක්ෂයේ විනය කඩ කලාවේ.

29. පාක්ෂිකයෙක් සාමාජිකයෙක් හෝ පක්ෂ මණ්ඩලයක් තමා යටත් විය යුතු යම් තීරණයක් සමඟ එකඟ නොවේ නම් ඒ තීරණයන්ට විරුද්ධව ඉල්ලීමක් ඊළඟ ඇති ඉහළ පාක්ෂික මණ්ඩලයට හා පාක්ෂික සම්මේලනයට ඉදිරිපත් කිරීමට තමාට බලය තිබේ. එහෙත් එම මුල් තීරණ වෙනස් වන තුරු එයට යටත් විය යුතුයි.

30. පක්ෂයේ සම්මේලනයේ හෝ මධ්‍යම කාරක සභාවේ හෝ වෙනයම් පාක්ෂික මණ්ඩලයක හෝ තීරණයන් පිළිබඳව තම අදහස් ද තහවුරු කිරීමට අවශ්‍ය වන අන් කරුණු ද අභ්‍යන්තර නිවේදන පත්‍රිකාවේ පල කිරීමට ඕනෑම පාක්ෂිකයෙකු හෝ පාක්ෂික මණ්ඩලයකට හෝ අයිතිවාසිකම් තිබේ.

31. යම් පාක්ෂිකයෙක් හෝ සාමාජිකයෙක් පක්ෂයේ තීරණ වලට හෝ පක්ෂයේ ක්‍රියාමාර්ගයනට හා එහි ක්‍රියා කලාපයට හෝ පටහැනි අදහස් ද, මතද, පක්ෂයෙන් බැහැර පල කෙරේ නම් ඒ පාක්ෂිකයා පක්ෂයේ විනය බරපතල අන්දමින් කඩ කිරීමට වැරදි කරුවෙක් වේ.

## 32. කණ්ඩායම් :-

කිසියම් විවාදාත්මක ප්‍රශ්නයක් පිළිබඳව කණ්ඩායමක් තැනීමට යම් පාක්ෂිකයන් පිරිසක් කැමති වෙත් නාමඑබඳු කණ්ඩායමක් සෑදීමට ඔවුන් මධ්‍යම කාරක සභාවෙන් අවසර ගත යුතුය.
එබඳු අවසරයක් දීමේදී අවශ්‍ය අනපනත් හා කොන්දේසි එයට දීමේ බලය මධ්‍යම කාරක සභාවට තිබේ.

## 33. විනයානුකූල ක්‍රියා :-

යම් පාක්ෂිකයෙක් විනය කඩ කරන ලද්දේ යයි විනය පාලක කොමිසම නිගමනය කරන්නේ නම් ඔහුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ. ඒ දඬුවම පාක්ෂිකත්වය තාවකාලිකව නතර කිරීම හෝ ස්ථිර පාක්ෂිකයෙකු සාමාජිකයෙකු බවට පත් කිරීමට හෝ පක්ෂයෙන් මුළුමණින්ම අස් කිරීම හෝ විය හැකිය.

34. පාක්ෂිකයන් අතර විනය කඩ කරන ලද හැම අවස්ථාවක්ම ඒ ඒ ලෝකල් සභා විසින් හෝ ප්‍රාදේශීය සභාව විසින් හෝ විනයානුකූල දඬුවම් ලබාදීම් වස් මධ්‍යම කාරක සභාව වෙත වාර්තා කළ යුතුය.

35. පක්ෂයේ යම් සංවිධානයක් පක්ෂයේ විනය කඩ කරන ලද්දේ යයි මධ්‍යම කාරක සභාවට පැහැදිලි වුනේ නම්, ඒ හැම විටකම එම සංවිධානය විසුරුවා හැරීමට හෝ විනය රැකගැනීම සඳහා එහි ආකෘතිය වෙනස් කිරීමට හෝ මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

36. පක්ෂයෙන් නෙරපීමෙන් විනයානුකූලව දඬුවම් පමුණුවන ලද හැම අවස්ථාවක්ම මධ්‍යම කාරක සභාව විසින් ඉන් පසුව ළඟම පැමිණෙන සාමාන්‍ය සම්මේලනයට දැක්විය යුතුය.

## 37. ව්‍යවස්ථා සංශෝධනය :-

මේ ව්‍යවස්ථා සංශෝධනය කළ හැක්කේ පක්ෂයේ සම්මේලනයක තීරණය පිට පමණක්ය.

1982 අප්‍රේල් 2 - 3 - 4 - යන දිනයන්හීදී පැවැත්වූ නව සම සමාජ පක්ෂයේ පාක්ෂික සම්මේලනයේදී අනුමත කල වාර්තාව.